Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# මහරගම නගර සභාව

මහරගම නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ රියදුරු තනතුරු සඳහා (කසල ප්‍රවාහන වාහන සඳහා) බඳවා ගැනීම් කිරීමට සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාතේ පදිංචි පුරවැසියන් වෙතින් අයදුම්පත් 2019.04.30 වැනි දින දක්වා භාර ගනු ලැබේ.

අයදුම්පත් "ලේකම්, මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට 2019.04.30 වැනි දින දහවල් 12.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩු කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(01) වැටුප් පරිමාණය: රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990
රා.ප.ච. 3/2016 (උපලේඛන II අනුව)

(02) බඳවා ගන්නා ශ්‍රේණිය: III ශ්‍රේණිය

(03) අධ්‍යාපන සුදුසුකම් : 8 ශ්‍රේණිය සමත් වීම (9 වසර) සමත් වී තිබිය යුතුය.

(04) වෘත්තීය සුදුසුකම් :

(i) තාරබර හොන්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ පැදවීමේ රියදුරු බලපත්‍ර ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03)ට පෙර අවම වශයෙන් A1 සහ C 1 පන්තියේ බලපත්‍රයක් හෝ නව බලපත්‍රය අනුව බී සහ ඩී 1 පන්තියේ බලපත්‍රය ලබා තිබීම.

(ii) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුම

(05) පළපුරුද්ද : බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

(06) සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායක විය යුතුය.

(ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට යටත් විය යුතු වේ.)

(iii) මෙම තනතුර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(07) වෙනත් සුදුසුකම්

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම

(ii) සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 3ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

(iv) යහපත් චරිතයකින් යුක්ත වීම.

(v) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබීම.

(vi) අවම උස අඩි 5 විය යුතුය. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.

(08) වයස සීමාව : අයදුම්පත් කැඳවන දිනට අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය

(09) බඳවා ගැනීමේ ක්‍රමය :

වෘත්තීය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මගින්,

වෘත්තීය පරීක්ෂණය

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| (i) රිය පැදවීමේ නිපුණතාව | 40 | 20 |
| (ii) මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| (iii) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |
| මුළු ලකුණු | 100 | |

(10) ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද/මුදල් රෙගුලාසි වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනවලට අදළ ආඥා පනත්වල විධිවිධාන වලටද, මහරගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතුය.

(11) මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මහරගම නගර සභාවේ ලේකම් සතුය.

එස්. ඒ. කේ. එන්. ඉන්ද්‍රජිත්,
ලේකම්,

2019 මාර්තු මස 25 වන දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල........................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්)
...........................................................................................................................
...........................................................................................................................

03. මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්)
...........................................................................................................................
...........................................................................................................................

(ii) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |

(iii) තාවකාලික ලිපිනය (සිංහලෙන්)
..............................................................................................................................
..............................................................................................................................

05. උපන් දිනය : අවුරුද්ද [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

07. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

(උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත් ඇමිණිය යුතුය.)

08. විවාහක/අවිවාහක බව :____________________

09. දුරකථන අංක : පෞද්ගලික :____________________

10. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව :____________________
(ග්‍රාමසේවා සහතිකය මගින් සනාථ කළ යුතුය.)

11. අධ්‍යාපන සුදුසුකම් :
..............................................................................................................................
..............................................................................................................................
(සුදුසුකම් සහතික කිරීමට අදළ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.

12. පළපුරුද්ද:
..............................................................................................................................

13. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා හා වෙනත්) :
..............................................................................................................................
..............................................................................................................................
(සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහතික කළ ඡායාපිටපත් ඇමිණිය යුතුය.)

14. i. ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද? (ඔව්/නැත)
ii. ඔබගේ පිළිතුර ඔව් නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද?
..............................................................................................................................
..............................................................................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල.......................................III වන ශ්‍රේණියේ තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා ..........................III වන ශ්‍රේණියේ තනතුරකට නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

..............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :____________________